# සොල්දාදුවාගේ ගීතය

නොඑන ගමන් යන මා ගත දැවී
නොහඬන් මලනුවනේ
අපරාජිත ලෙස රණ බිම වැද හෙව
මයදිමත් සැපතකිය මහා

මරණ මංචකේ වැතිරී අම්මා
කී දේ මතකද නුඹට මලේ
උපන් භූමියට බරක් නොවී ඉඳ
අබරණයක් වී මැරෙන් පුතේ

බහ තෝරන සන්දියෙ ඉඳලම අපි
ඇසුවේ රණවිරුවන්ගෙ කතා
සුරංගනා ලෝකයෙන් මිදෙන්නට
ඇස් පාදා දුන්නේ අම්මා

පළමුව මව්බිම නුඹ ඉපදුන රට
ජාතිය ආගම ගැන සිතලා
බුදු ගුණ සිහිකර තබපන් පියවර
ජය පිට ජය එයි නුඹ සොයලා

මගේ අතින් ගිලිහියන අසිපත
නුඹෙ සුරත රැදෙනා වේලේ
යගදාවක් වී සියොළඟ වෙවුලා
නීලමහා බල ඇති වේවා

මරණය අබියස හිමාලයක් වී
බුද්ධ මන්ත්‍රයෙන් වරම් ලබා
අම්මා කිරි කර දුන් අමා බෙලෙන්
නීල මහා බල ඇති වේවා